# ශ්‍රී ලංකාවේ
# විසම්මුතිය මර්දනය

**2014 නොවැම්බර් 22- 2015 ජනවාරි 31**

**ජනාධිපතිවරණ ආවරණය**




ජනමාධ්‍යවේදීන්, වෘත්තීය සමිති ක්‍රියාකාරීන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් ජනාධිපතිවරණ කාල සීමාව තුළ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස මර්දනය කිරීම පිළිබඳව  විරෝධතාවයක (ඡායාරූපය - 2014 දෙසැම්බර් 12 විකල්ප )

**INFORM**
**Human Rights Documentation Centre**
www.ihrdc.wordpress.com informcolombo@gmail.com

## ආවරණය කළ සිදුවීම්

මෙම කළාපය 2014 නොවැම්බර් 22 දින සිට 2015 ජනවාරි 31 දක්වා සිදුවීම් සහ පහත දැක්වෙන උප මාතෘකා යටතේ ජනාධිපතිවරණ කාල සීමාව තුළ වාර්තා වූ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීමද ආවරණය කරයි.

**A.** ඝාතන, වෙඩි තැබීම්, පහර දීම්

**B.** මරණ තර්ජන සහ වෙනත් තර්ජන

**C.** නිවාස, පක්ෂ කාර්යාල, වෙළඳ ආයතන සහ වාහන වලට පහර දීම

**D.** රැස්වීමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝණය කිරීම්

**E.** ඡන්ද පළ නිලධාරීන්ට සහ මැතිවරණ නිරීක්ෂකයින්ට පහරදීම්, තර්ජන සහ තහංචි

ඉන්ෆෝම් ආයතනය 1990 දී ආරම්භ කරන ලද්දේ විශේෂයෙන් ම වාර්ගික ගැටුම සහ යුද්ධය සන්දර්භයෙ හි ශ්‍රීලංකා වේ මානව හිමිකම් තත්ත්වය නිරීක්ෂණය කරමින් කරුණු ගොනු කිරීමටත් එම කරුණු ලිඛිත සහ වාචික මැදිහත් වීම් හරහා ප්‍රාදේශීයව, ජාතිකව සහ ජාතයන්තරව වාර්තා කිරීමටත් ය. එසේම සිය අයිතීන් නිරන්තරයෙන් සහ ක්‍රමවත් ලෙස කෙලෙසීමට ලක්වන අනෙක්ජන ප්‍රජාවන් සමග ද ඉන්ෆෝම් ආයතනය කටයුතු කරයි. වර්තමානයේ දී ඉන්ෆෝම් ආයතනය මැතිවරණ නිරීක්ෂණය,මාධ්‍ය නිදහස සහ මානව හිමිකම් ආරක්ෂකයින් සම්බන්ධයෙන් සිය අවධානය යොමු කර තිබේ. ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටා ඇති ඉන්ෆෝම් ආයතනය දේශීය ක්‍රියාධරයින්, කණ්ඩායම් සහ ජාලයන් සමඟ මෙන්ම කලාපීය සහ ජාතයන්තර මානව හිමිකම් ජාලයන් සමග සහයෝගයෙන් කටයුතු කරයි.

## සාරාංශය:

2014 වර්ෂය විසම්මුතිය මර්දන කිරීම් බහුල ලෙස අත් දුටු වර්ෂයක් විය. ඉන් පසු, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ ගේ ඉල්ලීම මත 2015 ජනවාරි 8 වන දින ජනාධිපතිවරණයක් පැවැත්වෙන බව මැතිවරණ කොමසාරිස්වරයා නිවේදනය කළේය. දින කිහිපයකට පසු, ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ නියෝජනය කරමින් තමා විපක්ෂයේ පොදු අපේක්ෂකයා ලෙස ජනාධිපතිවරණයට තරග කරන බව එවකට රාජපක්ෂ රජයේ සෞඛ්‍යය අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් වූ මෛත්‍රීපාල සිරිසේන මහතා නිවේදනය කළේය.

එතැන් පටන්, දේශපාලඥයෝ විශාල පිරිසක් පාලක එක්සත් ජනතා නිදහස් සන්ධාය හැර දා සිරිසේන මහතාට සහය දක්වන බවට ප්‍රතිඥා දුන්හ. ප්‍රධාන විපක්ෂය වූ එක්සත් ජාතික පක්ෂය, ප්‍රමාණයෙන් කුඩා වුවත් විශාල බලපෑමක් ඇති කළ හැකි ජාතික හෙළ උරුමය සහ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ද පොදු අපේක්ෂකයා වෙත සහයෝගය පළ කළහ. ග්‍රාමීය සිංහල බෞද්ධ ප්‍රජාව කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි ජනතා විමුක්ති පෙරමුණද මෛත්‍රීපාල සිරිසේන මහතා වෙත නොකියා සිය සහයෝගය දැක්වූයේ පැවති රාජපක්ෂ රජය ප්‍රසිද්ධියේ විවේචනය කරමින්ය. ඉන් අනතුරුව සුළුතර ප්‍රජාවන් නියෝජනය කරන ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය සහ දෙමල ජාතික සන්ධානය ද ඔවුන්ගේ සහයෝගය සිරිසේන මහතා වෙත දක්වන ලදී. නීතීඥවරු, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, කලා කරුවන්, රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජාවන් වෙත බලපෑමක් ඇති කළ හැකි බෞද්ධ සහ ක්‍රිස්තියානි පූජකවරුන්ද රහසින් මෙන්ම විවෘතව ද සිරිසේන මහතාගේ මැතිවරණ ව්‍යාපාරයට සහය දැක්වීමට ආරම්භ කළහ.

එනයින්, රාජපක්ෂ කදවුරට සිය මැතිවරණ ව්‍යාපාරය ගෙන යාම සදහා ඉතිරිවූයේ රාජ්‍ය මාධ්‍ය, රාජ්‍ය සම්පත්, ආරකංෂක අංශ, පොලීසිය සහ සෙසු රාජ්‍ය ආයතනයන්ය. මෙම වාර්තාවේ අවධාය යොමු කරන්නේ රාජපක්ෂක කදවුර විසින් රාජ්‍ය සම්පත් අපයෝජනය කළ ආකාරය පිළිබදව නොව මැතිවරණය ප්‍රකාශයට පත් කළ දින සිට විපක්ෂ දේශපාලන පක්ෂ මුහුණ දුන් මර්දනයන් පිළිබදවයි. ප්‍රධාන විපක්ෂයේ ජනාධිපතිවරණ අපේක්ෂක සහ ඔහුගේ ප්‍රධාන ආධාරකරුවන් දෙදෙනා, විපක්ෂ නායකවරයා සහ හිටපු ජනාධිපතිවරිය යන අය පහරදීම් වලට බදුන් වූහ. මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩක්‍රියා හේතුවෙන් අවම වශයෙන් පුද්ගලයන් දෙදෙනෙකු මරණයට පත් වී ඇති තර තවත් බොහෝ පිරිසක් තුවාල ලැබූහ. තවත් බොහෝ පිරිසකට මරණ තර්ජන එල්ල විය. විපක්ෂ දේශාපාලඥයින්ට සහ ආධාරකරුවන්ට අයත් පක්ෂක කාර්යාල, නිවාස, ව්‍යාපාරික ස්ථාන සහ වාහන වලට පහරදීම්ද ගණනාවක් වාර්තා විය. ඡන්ද පළ නිලධාරීන් සහ මැතිවරණ නිරීක්ෂකයින් වෙතද තර්ජන එල්ල විය. ජ්‍යොෂ්ඨ ජනමාධ්‍යොවේදීන් ප්‍රශ්න කිරීම් සහ මරණ තර්ජන වලට ගොදුරු විය. පොදු අපේක්ෂකයා වෙත සහය පළ කළ කලාකරුවන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් ද විවිධ පහරදීම් වලට ගොදුරු වූ අතර ඔවුන් වෙත තර්ජනද එල්ල විය.

මැතිවරණ දිනය වන තුරුම මෙසේ ප්‍රචණ්ඩ ක්‍රියාවලට ගොදුරු වූ බහුතරය වූයේ පොදු අපේක්ෂකයා වෙත සහය දැක්වූ පිරිස්ය. මරණ තර්ජන , බිය ගැන්වීම් සහ සිදු වූවා යැයි කියන, ප්‍රචණ්ඩක්‍රියා දූෂණ සහ දූරාචාර පිළිබදව එල්ල කරන පදනම් විරහිත චෝදනා පිළිබදව මැතිවරණය අවසන් වී දින කිහිපයකින් පසු හිටපු ජනාධිපතිවරයාගේ ප්‍රධාන පෙළේ ආධාරකරුවන් පැමිණිළි කළේය. මින් එක් අයෙකු වූයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන හිටපු ජනාධිපතිවරයාගේ පුත් නාමල් රාජපක්ෂය. හිටපු ජනාධිපති රාජපක්ෂගේ ආධාරකරුවන්ට සහ දේපල වලට ප්‍රහාර එල්ල විය. රාජපක්ෂ රජය යටතේ දෝශාභියෝගයක් මගින් ව්‍යවස්ථා විරෝධීව තනතුරෙන් පහ කළ ශ්‍රී ලංකාවේ 43 වන අග විනිසුරුවරිය නැවත සේවයේ පිහිටුවීමට නීතීඥවරු සහ සිවිල් සමාජ සංවිධාන කළ විරෝධා ව්‍යාපාර සති කිහිපයක් ඇතළත සමත් විය.

මැතිවරණයෙන් අනතුරුව දෙමල ජාතික ක්‍රියාකාරීන් ලුහුබැද යාම පිළිබද හුදකලා සිදුවීම් උතුරු ප්‍රදේශ වලින් වාර්තා විය. කෙසේ වෙතත් ජනවාරි මාසය අවසන් භාගය වන විට ශ්‍රී ලංකාව තුළ විසම්මුතිය මර්දනය කිරීම 2014 වර්ෂයට සාපේක්ෂව විශාල ලෙස පහල ගොස් තිබුණි.




මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විසින් නිකුත් කළ පෝස්ටරය

## A. ඝාතන, වෙඩි තැබීම් සහ පහරදීම්

### 1. ජනවාරි 11 : නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ ආධාරකරුවන්ට පහරදීම

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ආධාරකරුවෙකු පහර කෑමට ලක් විය. මෙසේ පහර කෑමට ලක්වූ ජෙයරත්නම් නැමැත්තා කියා සිටි පරිදි දෙමල මක්කල් විද්තලායි පුලිකාල් පක්ෂයේ (TMVP) ආධාරකරුවන් විසින් තියුණු පිහියකින් ඔහුගේ අත කපා තර්ජනය කර සිරිසේන මහතාගේ ආධාකරකරුවන් හෙළි කරන ලෙස බල කර ඇත. (CMEV)

### 2. ජනවාරි 11 : එජාප රථ පෙළට ප්‍රහාර

එක්සත් ජාතික පක්ෂයේ ප්‍රාදේශීය නායක ඒ.ජී විජේතුංග ගමන් කළ රථ පෙළකට මහනුවර පාත දුම්බර ප්‍රදේශයේදී ප්‍රහාරයක් එල්ල විය. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ඇමතූ රැස්වීමකට සහභාගී වී ආපසු යන අතරතුර මෙම ප්‍රහාරය එල්ල වී ඇත. විජේතුංග මහතාට අනුව එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුගේ ආධාරකරුවන් 30ක් පමණ බස් රථය නවත්වා මෙසේ පහර දී ඇත. පහරදීමෙන් තුවාල ලැබූ පුද්ගලයන් 9 දෙනෙකු ජම්බුගස්පිටිය රෝහලට ඇතුළත් කර තිබූ අතර පසුව ඔවුන් පේරාදෙණිය මහරෝහල වෙත මාරු කර යැවිණි. CIB 11169/130 යන අංකය යටතේ පොලිස් පැමිණිල්ලක් ගොනු කර ඇති අතර සිදුවීමට අදාල සැක කරුවන් තිදෙනෙක් අත්තඩංගුවට ගත් බව වත්තේගම පොලීසිය පැවසුවේය. තුවාල ලැබූ පුද්ගලයන් 8 දෙනෙකු පේරාදෙණිය රෝහලේ ප්‍රතිකාර ලබන බව වාර්තා විය. (CMEV)

### 3. ජනවාරි 10 : ගැටුමකදී එජාපයේ ආධාරකරුවෙක් මරුට, තිදෙනෙක්ට තුවාල

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකරුවෙකු වන ජේ.ආර්. සරත් නැමැත්තා සහ ඔහුගේ පුත්‍රයාව හමු වීම සඳහා වර්ණකුලසූරිය මංජුල ප්‍රසන්න ඇතුළු එජාපයේ ආධාරකුවන් 6 දෙනෙක් බංලගාදෙණිය සිට කඹුරුපිටිය දක්වා වාහනයකින් ගමන් කර ඇත. එහිදී දෙපිරිස අතර ගැටුමක් ඇති වී මංජුල ප්‍රසන්නගේ හිසට තුවාල සිදු වූ අතර හලාවත මහ රෝහලේදී එහු මිය ගිය බව පසුව වාර්තා විය. (CMEV)

### 4. ජනවාරි 10 : එජනිස ආධාරුකරුවෙකුගේ පවුලේ අයට පහර දෙයි

වාහන 10 – 12කින් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකරුවෙකු වන සුනිත් ගුණසේකරගේ නිවසට පැමිණි පිරිසක් විසින් ඔහුගේ බිරිදට සහ මවට පහර දී ඇත. CIB III 107/135 යන අංකය යටතේ ජා ඇල පොලීසියේ මේ පිළිබඳව පැමිණිල්ලක් ගොනු කර ඇති අතර පහරදී සිදු කළේ එජාප නාගරික මන්ත්‍රී අන්ජු බව පැමිණිල්ලේ සඳහන් කර ඇත.

### 5. ජනවාරි 08 : කාන්තාවන් දෙදෙනෙකුට පහර දේ

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ හිටපු සහ ඔහුගේ ආධාරකරුවන් පිරිසක් විසින් යටියන ප්‍රාථමික විද්‍යාලය අසල දී (ඡන්ද මධ්‍යස්ථාන අංක 51) කාන්තාවකට පහර දී ඇත. මේ පහර දීම සිදුවී ඇත්තේ ජනවාරි 08 වන දින පස්වරු 01.00ට

පමණය. නියෝජ්‍ය අමාත්‍යවරයා සහ ඔහුගේ ආධාරකරුවන් වාහන 07කින් ප්‍රදේශය වටා සැරිසැරූ බවද වාර්තා විය. (CMEV)

**6.** ජනවාරි 08 : **ශ්‍රීලංමුකොං පහර දී බිය ගන්වයි**
ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයේ සාමාජික තල්හා මහතාට හිටපු අමාත්‍ය ඒ.එල්.එම් අතුල (ජාතික කොන්ග්‍රසය) විසින් අක්කරෙපත්තු ප්‍රදේශයේදී පහර දී ඇත. මේ පහරදීම පිළිබඳව තල්හා මහතා විසින් පොලිස් පැමිණිල්ලක් ගොනු කර ඇත. (CMEV)

**7.** ජනවාරි 07 : **වෙඩි වැදුණු තුවාල හේතුවෙන් නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ ආධාරකරුවෙක් මිය යයි**
2015 ජනාධිපතිවරණයේ පළමු මරණය මැතිවරණට දිනකට පෙර සිදුවිය. ජනවාරි 05 වන සඳුදා උදැසන රත්නපුර කහවත්ත ප්‍රදේශයේදී සිදුවූ වෙඩි තැබීමකදී බරපතල ලෙස තුවාල ලැබූ ශාන්ත දොඩංගොඩ මහතා සවස 03.05ට පමණ රත්නපුර රෝහලේදී මිය ගියේය. හිටපු බලශක්ති අමාත්‍ය ප්‍රේමලාල් ජයසේකර, හිටපු අමාත්‍ය නිලන්ත ජයකොඩි සහ ප්‍රාදේශීය සභා සභාපති වජිර දර්ශන ද සිල්වා යන පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට පැල්මඩුල්ල මහේස්ත්‍රාත් අධිකරණය විසින් වරෙන්තු නිකුත් කළ නමුත් ජනවාරි 07 වන දින වන තුරුත් කිසිවෙකු අත්අඩංගුවට ගෙන නොතිබිණි. (CMEV)

**8.** ජනවාරි 05 : වෙඩි තැබීමකදී තිදෙනෙකුට තුවාල
පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් ඇමතීමට නියමිතව තිබූ රැස්වීමක් සඳහා භූමිය සකස් කරමින් සිටි එක්සත් ජාතික පක්ෂයේ ආධාරකරුවන් පිරිසකට නාඳුනන පිරිසක් විසින් වෙඩි තබන ලදී. පොලිස් ස්ථානාධිපති එල්.පී.කේ රාජමන්ත්‍රී මහතා පැවසූ ආකාරයට මෙම වෙඩි තැබීමෙන් පුද්ලයන් තිදෙනෙකු තුවාල ලබා ඇත. මෙලෙස තුවාල ලබා ඇත්තේ ඩී.අයි.ඩබ්. කරුණාදාස රණසිංහ, එච්. හුසේන් දුල්ෂාන් සහ සමන්ත දොඩංගොඩ යන අය වන අතර මොවුන් රත්නපුර රෝහලෙන් ප්‍රතිකාර ලබා ගෙන ඇත. (CMEV)

**9.** ජනවාරි 05 : එජාප සාමාජිකයෙකුට පහර දේ
එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙකු වන වජිර මනෝජ් මහතා ට ජනවාරි 05 වන දින ප්‍රහාරයක් එල්ල වී ඇති අතර පසුව ඒ මහතාව හලාවත රෝහලට ඇතුළත් කර ඇත. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ රියැදුරු විසින් තමාට ආරච්චිකට්ටුව පොදු වෙළඳ පොළ අසලදී තමාට පහර දුන් බව හෙතෙම රෝහල් පොලීසියට ලබා දුන් ප්‍රකාශයේ සඳහන් විය. (CMEV)

**10.** ජනවාරි 05 : **නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ කාර්යාලයේ රැදී සිටි පුද්ගලයන්ට තර්ජන**
මඩකලපු දිස්ත්‍රික්කයේ වාලච්චේනෛ ප්‍රදේශයේ කරුවක්කෙනි කලවානි මාර්ගය අසල පිහිටුවා තිබුණු නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ කාර්යාලයේ රැඳීසිටි පුද්ගලයන් ට තමිල් මක්කල් විඳුතලායි පුලිකාල් පක්ෂයේ (TMVP) නායක පිල්ලයාන් හෙවත් චන්ද්‍රකාන්ත් විසින් තර්ජනය කළ බවට චෝදනා එල්ල විය. ඔහු විසින් නව ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ පී. සුලක්ෂාන් මහතාට මරණ තර්ජන එල්ල කළ බවද වාර්තා විය. මෙම තර්ජන එල්ල කරන විට ඔහු සතුව පිස්තෝලයක් තිබී ඇති බව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වාර්තා කළේය. (CMEV)

**11.** ජනවාරි 05 : **එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ප්‍රචාරක සංවිධායකට පිහි පහර**
කෝපායිහි නවලාර් විද්‍යාලය අසලදී නාඳුනන පුද්ගලයන් දෙදෙනෙකු විසින් ජනවාරි 05 වන දින එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සංවිධායක 38 වියැති ආරුමුගම් චන්ද්‍රකුමාර් මහතාගේ පිටට සහ අතට පිහියකින් තුවාල සිදු කර ඇත. මෙම සිදුවීම් සිදු වී ඇත්තේ ආසන්න වශයෙන් පස්වරු 9.20ට පමණය. පිහි පහරට භාජනය වූ පුද්ගලයාව එසැනින්ම කෝපායි රෝහලට ඇතුළත් කළ බවත් ඉන් පසු යාපනය මහ රෝහල වෙත යැවූ බවත් කෝපායි පොලිස් ස්ථානාධිපති අයි.පී.ජයකොඩි මහතා ප්‍රකාශ කළේය. (CMEV)

**12.** 2014 දෙසැම්බර් 28 : විපක්ෂ ආධාරකරුවන් පැහැර ගැනීම සහ පහර දීම
මඩකලපුව සිවනන්ද පිටිය අසලදී පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ආධාරකරුවන් පිරිසකට ප්‍රහාරයක් එල්ල වී ඇත. මඩකළපුවේ පැවැත්වීමට නියමිතව තිබූ සිරිසේන මහතාගේ රැස්වීමක් සඳහා කටයුතු සූදානම් කරමින් සිටි අතර තුරු පස්වරු 3.45ට පමණ මෙම පහර දීම සිදු වී ඇත. TMVP පක්ෂයේ ආධාරකරුවන් පිරිසක් පැමිණි එජාපයේ මඩකළපු සංවිධායක කේ. මෝගන් සහ ඔහුගේ ආධාරකරුවන්ට තර්ජනය කර ඇත. එහිදී එක් එජාප ආධාරකරුවෙක් පැහැරගෙන ගොස් දෙදෙනෙකුට දරුණු ලෙස පහර දී ඇති අතර ඔවුන්ව පසුව රෝහල් ගත කෙරුණි. (CaFFE)

**13.** 2014 දෙසැම්බර් 27 : විපක්ෂ ආධාරකරුවන් ට පහර දෙයි

රැස්වීමක් අවසන් වී ත්‍රී රෝද රථයකින් ගමන් කරමින් සිටි පොදු අපේක්ෂකයාගේ ආධාරකරුවන් පිරිසකට උඩහගෝඩ නමනෙලිය ප්‍රදේශයේදී ප්‍රහාරයක් එල්ල වී ඇත. එහිදී පුද්ගලයන් දෙදෙනෙකුට දරුණු ලෙස පහර දී ඇත. ඊට අමතරව, පොදු අපේක්ෂකයාගේ මැතිවරණ ව්‍යාපාරයට සහය දැක්වූ මල්වත්ත ප්‍රදේශයේ ප්‍රබල එජාප ආධාරකරුවන් දෙදෙනෙකු වන මහින්ද සහ වන්නිආරච්චි සහ ඔවුන්ගේ සගයින් තිදෙනෙකුට ආයුධ රැගෙන යතුරුපැදි වලින් ගමන් කළ පුද්ගලයන් පිරිසක් විසින් දෙසැම්බර් 27 වන දින තර්ජනය කර ඇත. පහරදුන් පුද්ගලයන් විසින් එජාප ආධාරකරුවන් වෙත ආයුධ එල්ල කර පොදු අපේක්ෂකයාගේ මැතිවරණ ව්‍යාපාරයට සහය දීමෙන් වළකින ලෙස තර්ජනය කර ඇත. (CaFFE)

**14.** 2014 දෙසැම්බර් 21 : විපක්ෂ ආධාරකරුවන්ට පහර දේ

දෙසැම්බර් 24 වන දින වැල්ලම් පිටිය ප්‍රදේශයේදී පැවැත්වීමට නියමිතව තිබූ පොදු අපේක්ෂකයාගේ මැතිවරණ රැලියක පෝස්ටර් අලවමින් සිටි ආධාරකරුවන් පිරිසකට දෙසැම්බර් 2 වන දින සුදු වෑන් රථයකින් පැමිණි පිරිසක් විසින් ප්‍රහාරයක් එල්ල කර තිබුණි. ප්‍රහාරය සඳහා පැමිණි පුද්ගලයන් ආයුධ අතැතිව සිටි අතර ආධාරකරුවන් දෙදෙනෙකුට තියුණු ආයුධ වලින් පහර දී තුවාල සිදු කර ඇති අතර ඔවුන් පසුව රෝහල් ගත කර ඇත. (CaFFE)

**15.** 2014 දෙසැම්බර් 19 : **සිවිල් වැසියන්ට පහර දී එක් පුද්ගලයෙකු නිරුවත් කරයි**

පූජ්‍ය අම්පිටියේ සුමනරතන හිමියන් විසින් මෙහෙය වූ සිවිල් වැසියන් කණ්ඩායමකට දෙසැම්බර් 19 වන දින පොලීසිය විසින් පහර දී ඇත. සිය ඡන්ද අයිතිය ආරක්ෂා කරන ලෙස ඉල්ලමින් විරෝධතාවයක යෙදුණු මෙම පිරිසට පහර දී ඇත්තේ මඩකළපුව පොලීසිය ඉදිරිපිටදීය. "ප්‍රදේශයේ නියෝජ්‍ය පොලිස්පති නන්ද මුණසිංහ සහ මඩකලපුව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂ යෙට්ටිආරච්චි ඇතුළු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් ඉදිරිපිට අපිට හිරිහැර කිරීම, පහර දීම සහ නිරුවත් කිරීම පිළිබඳව දැඩි අපකීර්තියට පත්වනවා" යනුවෙන් සුමනරතන හිමියන් ප්‍රකාශ කළේය.
http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=116365



එක් විරෝධතාකරුවෙකු පොලීසිය විසින් නිරුවත් කිරීම ( ඡායාරූපය: CaFFE)

**16.** 2014 දෙසැම්බර් 09 : විපක්ෂ ආධාරකරුවන්ට හිරිහැර

දෙසැම්බර් 19 වන දින මහනුවර පැවති රැළියකට සහභාගී වී ආපසු යන අතරතුර කටුගස්තොට සමපාලම අසලදී විපක්ෂ ආධරකරුවන් පිරිසක් පහර කෑමකට ලක් වී ඇත. කැබ් රථයකින් පැමිණි මෙම පිරිස එල්ල කළ ප්‍රහාරය හේතුවෙන් පුද්ගලයන් සිවු දෙනෙක් කටුගස්තොට රෝහලට ඇතුළත් කර තිබිණි. බස් රථයකින් ආපසු ගමන් කරමින් සිටි ආධාරකරුවන් පිරිසකටද ප්‍රහාරයක් එල්ල වී ඇත. (CaFFE)

**17.** ජනවාරි 06 : **එජාප ආධාරකරුවෙකුගේ පවුලේ සාමාජිකයෙකුට පහරදේ**
ජනවාරි 06 වන දින පස්වරු 6.00ට පමණ එක්සත් ජාතික පක්ෂයේ ආධාරකරුවෙකු වන ජානක අබේරත්න මහතා සොයා පැමිණි මැර පිරිසක් ඒ මහතාගේ පවුලේ සාමාජිකයන් ට පහර දී ඇත. (CMEV)

**18.** ජනවාරි 05 : එජාප සාමාජිකයෙකුට පහර දෙයි
එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙකු වන වජිර මනෝජ් මහතා ට ජනවාරි 05 වන දින ප්‍රහාරයක් එල්ල වී ඇති අතර පසුව ඒ මහතාව හලාවත රෝහලට ඇතුළත් කර ඇත. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ රියැදුරු විසින් තමාට ආරච්චිකට්ටුව පොදු වෙළඳ පොළ අසලදී තමාට පහර දුන් බව හෙතෙම රෝහල් පොලීසියට ලබා දුන් ප්‍රකාශයේ සඳහන් විය. (CMEV)

**19.** 2014 නොවැම්බර් 24 : **විපක්ෂයේ රථ පේළියකට ප්‍රහාර**
එක්සත් ජාතික පක්ෂයේ වයඹ පළාත්සභා මන්ත්‍රී එච්.සී. අලවතුවල මහතා ගමන් කළ රථ පෙළක් කුරුණෑගල මාවතගම ප්‍රදේශයේදී ප්‍රහාරයකට ලක් වූ අතර වාහන හතරකට අලාභ හානි සිදු විය. එජපායේ ප්‍රාදේශීය සභා සභිකයෙකුට එහිදී තුවාල සිදු වූ අතර ඔහුව රෝහල ගත කරන ලදී. (CaFFE / http://www.thesundayleader.lk/2014/11/30/election-violence-and-violations/)

**20.** 2014 නොවැම්බර් 22 : විපක්ෂ ආධාරකරුවෙකුට වෙඩි
මෛත්‍රීපාල සිරිසේන මහතාගේ පක්ෂ මාරුවෙන් සුළු වේලාවකට පසු පොදු අපේක්ෂකයා වෙත සහය පළ කිරීමට මග්ගොන ප්‍රදේශයේ සංවිධාන කර තිබූ උත්සවයකදී වෙඩි තැබීමක් සිදුවී ඇත. හිටපු එජාප ප්‍රාදේශීය සභා මන්ත්‍රී චමිල රණසිංහ මෙම වෙඩිතැබීමේදී තුවාල ලැබූ අතර ඔහුගේ හිසට වෙඩි ප්‍රහාර කිහිපයක් එල්ල වී තිබුණි. එසැණින්ම ඒ මහතාව නාගොඩ රෝහලට ඇතුළත් කර ඇති අතර ඉන් පසු ජාතික රෝහලේ ස්නායු පිළිබඳ ඒකකයට මාරු කර යවා ඇත. (http://www.thesundayleader.lk/2014/11/30/election-violence-and-violations/)

## B. මරණ තර්ජන ඇතුළු වෙනත් තර්ජන කිරීම්

**21.** ජනවාරි 14 : **හිටපු ජනාධිපතිගේ පුත්‍රයාට මරණ තර්ජන**
තමාට කිසියම් පුද්ලයෙකු විසින් දුරකතනයෙන් මරණ තර්ජන එල්ල කළ බව එක්සත් ජනතා නිදහස් සන්ධානයේ හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, හිටපු ජනාධිපති ගේ පුත් නාමල් රාජපක්ෂ මහතා ජනවාරි 14 වන දින තංගල්ල පොලීසියට පැමිණිළි කළ බව තංගල්ල පොලීසිය ප්‍රකාශ කළේය. රාත්‍රී 11.00ත් 12.00ත් අතර කාලය තුළ එක් අංකයකින් ඇමතුම් කිහිපයක් මගින් මෙම තර්ජන එල්ල වී ඇත.
(http://www.dailymirror.lk/61207/namal-receives-death-threats#sthash.zEn3OX9D.dpuf**)**

**22.** ජනවාරි 13 : **දේශපාලඥයෙකුගේ බිරිඳට තර්ජන**
තමා පිවිතුරු හෙළ උරුමයේ දේශපාලන කටයුතු අතහැර දමා සති කිහිපයක් ඇතුළත රටින් පිටවී නොයන්නේ නම් සිය දරුවන් දෙදෙනා සහ තමාව මරා දමන බවට කිසියකම් පිරිසක් විසින් සිය බිරිඳට දුරකතනයෙන් තර්ජනය කළ බව පිවිතුරු හෙළ උරුමයේ මහ ලේකම් උදය ගම්මන්පිළ මහතා ප්‍රකාශ කළේය.
(http://newsfirst.lk/english/2015/01/gammanpila-reveals-contents-telephone-call/71930)

**23.** ජනවාරි 11 : **එජනිස ආධාරකරුවෙකුට තර්ජන**
එක්සත් ජාතික පක්ෂයේ ආධාරකරුවෙකු වන අනුර බණ්ඩාර විසින් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ බී.කේ. ධනුක මධුෂාන් මහතාට තර්ජනය කර පහර දීමට උත්සහ කර ඇත. මෙම සිදුවීම සිදුවී ඇත්තේ ගලෙන්බිඳුණුවැව එජාප පක්ෂ කාර්යාලය ඉදිරිපිටදීය. (CMEV)

**24.** ජනවාරි 10 : **නව ප්‍රජාත්නත්‍රවාදී පෙරමුණේ ආධාරකරුවෙකුට තර්ජන**
ඩබල් කැබ් රථයකින් පැමිණි නාදුනන පුද්ගලයන් සිවු දෙනෙකු විසින් මහනුවර සොකන්ව් ප්‍රාථමික පාසල ඉදිරිපිටදී සුජිත් නිස්සංක මහතාට මරණ තර්ජන එල්ල කර ඇත. සිරස ටීවී ඔස්සේ මෑතකදී විකාශය වුණු වැඩසටහනකදී මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපතිවරණය ජයග්‍රහණය කරන බවට මහාචාර්ය නිස්සංක අනාවැකි පළ කර තිබුණි. සිදුවීම සම්බන්ධයෙන් 119 CIB 314/11 අංකය යටතේ පොලිසියේ පැමිණිල්ලක් ගොනු කර ඇත. (CMEV)

**25.** ජනවාරි 10 **: නව ප්‍රජාත්න්ත්‍රාදී පෙරමුණේ ආධාරකාරියකට තර්ජන**

ජනවාරි 9 වන දින රාත්‍රී 8.30ට පමණ නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ එච්.එම් ප්‍රියන්ති හිරුකුමාරි මහත්මියගේ නිකවැරටියේ පිහිටි නිවසට පැමිණි නාඳුනන තුවක්කු කරුවන් විසින් දේශපාලන කටයුතු වලින් ඉවත් වන ලෙසට ඇයට තර්ජනය කර ඇත. සිය සැමියා සමග නිවසේ රැඳී සිටියෙදී මෙම තර්ජන එල්ල වී ඇති අතර 119 අමතා සිදුවීම දැනුම් දී ඇත. (CMEV)



බ්‍රිටෝ ප්‍රනාන්දු කොළඹ පැවති විරෝධතාවක් අමතමින් (ඡායාරූපය Vikalpa)

**26.** ජනවාරි 04 : මානව හිමිකම් ආරක්ෂකයින් බිය වැද්දවීම

මානව හිමිකම් ආරක්ෂකයෙකු වන බ්‍රිටෝ ප්‍රනාන්දු ජනවාරි 04 වන දින සිය පවුල සමග නිවාඩුවක් ගත කර ආපසු නිවසට පැමිණෙන අවස්ථාවේ නිවසේ ගේට්ටුවේ ප්ලාස්ටික් බෑගයක දැමූ බලු හිසක් එල්ලා තිබෙනු දැක ඇත. ඔහුගේ සගයෙකු වන 'ජීවිතයට ඇති අයිතිය' (Right to Life) සංවිධානයේ සේවක ප්‍රසන්න ප්‍රනාන්දු මහතාද එවැනිම සිදුවීමක් වාර්තා කර තිබුණි. 2014 ඔක්තෝබර් 27 වන දින Right to Life විසින් සංවිධානය කළ අතුරුදහන් වූවන් සැමරීමේ වැඩසටහනක් මෙම බිය ගැන්වීමට හේතුව ලෙස සැක කළ හැකි බව තමන් විශ්වාස කරන බව ඔවුහු ප්‍රකාශ කළහ. මෙම අතුරුදහන්වූවන්ගේ සැමරුම පැවති කාලය ආසන්නයේදී Right to Life සේවක මණ්ඩයේ සාමාජිකයන්ගේ සහ සෙසු මානව හිමිකම් ආරක්ෂකයින්ගේ මුහුණු වල ඡායාරූප ඇතුළත් පෝස්ටර් අලවා තිබුණි. 'මකර රාක්ෂයෝ අතුරුදහන් වූවන් විකුණන් කයි' යනුවෙන් එම පෝස්ටර් වල සඳහන් විය. මෙම සිදුවීමට අදාල මානව හිමිකම් ආරක්ෂකයින් දෙදෙනාම රාජපක්ෂ රජය දැඩිව විවේචනය කරමින් පොදු අපේක්ෂකයා වෙත සහය දැක්වූ විදියේ විරෝධය ව්‍යාපරයට සම්බන්ධ පුද්ගලයන්ය. සිදුවීමට අදාල කාලය සලකා බලන විට මෙම බිය වැද්දවීම් වලට හේතුව විදියේ විරෝධය හා සම්බන්ධව කටයුතු කිරීම බව සිතිය හැකිය. (CMEV)

## C. නිවාස, පක්ෂ කාර්යාල, වෙළඳ ආයතන සහ වාහන වලට පහර දීම

### 27. ජනවාරි 12 : එජනිස ආධාරකරුවෙකුගේ නිවසට ගල් ප්‍රහාර

15/19සී, උඩවෙල නව නගරය යන ස්ථානයේ පිහිටි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකාරියක වන ඩී.ආර්. අසන්තික මනුවීර ගේ නිවසට පාන්දර 2.00ට පමණ ගල් ප්‍රහාරයක් එල්ල වී ඇත. ප්‍රහාරය එල්ල වන අවස්ථාවේදී තමා සිය දරුවන් දෙදෙනා සමග නිවසේ රැඳී සිටි බව ප්‍රහාරයට මුහුණ දුන් කාන්තාව ප්‍රකාශ කළේය. අසල පිහිටි ඇගේ මවගේ නිවසට ගල් පහර එල්ල වී ඇත. (CMEV)

### 28. ජනවාරි 11 : එජනිස ආධාකරුවෙකුගේ නිවසට තාර ප්‍රහාර

නො 534, හුරුළුනික වැව ගලෙන් බිඳුණුවැව දරණ ස්ථානයේ පිහිටි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකරුවෙකු වන බී.ජී. ප්‍රේමචන්ද්‍ර මහතාගේ නිවසට නාඳුනන යතුරුපැදි දෙකකින් පැමිණි පිරිසක් විසින් තාර ප්‍රහාරයක් එල්ල කර ඇත. රාත්‍රී 10.30ට පමණ මෙම ප්‍රහාරය සිදු වූ ඇත. තමා මෙම සිදුවීම පිළිබඳ පොලිස් පැමිණිල්ලක් ගොනු නොකළ බව ප්‍රේමචන්ද්‍ර මහතා CMEV වෙත දන්වා ඇත.

### 29. ජනවාරි 11 :එජනිස ආධාරකරුවෙකුගේ නිවසට තාර ප්‍රහාර

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාර කරුවෙකු වන නොයෙල් ඉන්දික ප්‍රේමවංශ මහතාගේ නිවසට නිදුනන පිරිසක් විසින් තාර ප්‍රහාරයක් එල්ල කර ඇත. මෙම ප්‍රහාරය එල්ල වී ඇත්තේ පාන්දර 1.30ට පමණය. ගලෙන්බිඳුණුවැව පොලීසිය පැවසුමේ මෙම සිදුවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් ගොනු කර නොමැති බවයි. (CMEV)



විපක්ෂ ආධාරකරුවෙකුට අයත් ත්‍රිරෝද රථයකට ප්‍රහාරයක් (ඡායාරූපය CaFFE )

**30.** ජනවාරි 11 : **එජනිස ආධාරකරුවෙක්ගේ නිවසට තාර ප්‍රහාරයක්**
නො 530, හුරුළුනිකවැව, ගලෙන්බිදුණුවැව දරණ ස්ථානයේ පිහිටි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකරුවෙකු වන බී.කේ.ඩී. මධුෂාන් මහතාගේ නිවසට නාඳුනන කණ්ඩායමක් විසින් තාර ප්‍රහාරයක් එල්ල කර ඇත. මේ පිළිබඳ පොලිසියේ පැමිණිල්ලක් ගොණු කර නොමැති බව ඒ පිළිබඳ විමසීමේදී ගලෙන්බිදුණු වැව පොලීසිය. (CMEV)

**31.** ජනවාරි 11 : **එජනිස ආධාරකරුවෙකුගේ නිවසට තාර ප්‍රහාර**
එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකරුවෙකු වන කේ.ජී.මලිකා ගේ නිවසට ද නාඳුනන පිරිසක් විසින් තාර ප්‍රහාරයක් එල්ල කර ඇත. අංක 64-6463 දරණ අංක තරහඩුව සහිත සුදු පැහැති වෑන් රථයකින් පැමිණි මෙම පිරිස විසින් නිවසේ මිදුලට සහ ඉදිරිපස බිත්තියට හානි සිදු කර ඇත. මෙම සිදුවීම සම්බන්ධයෙන් පොලීසියේ පැමිණිල්ලක් ගොනු කර නොමැත. (CMEV)

**32.** ජනවාරි 11 : **නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ ආධාරකරුවන්ගේ නිවසට ප්‍රහාර**
නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ ආධාරකරුවන් වන ඩී.එම්. ලීලාවතී සහ කේ.එම්. කරුණාරත්න යන අයගේ නිවසට පස්වරු 1.30ට පමණ කඩා වැදුණු පිරිසක් විසින් පහර දී නිවැසියන්ට තුවාල සිදු කර ඇත. තුවාල ලැබූවන් අතර ඔවුන්ගේ පුතුන් දෙනොද වේ. යතුරුපැදි වලින්, යකඩ පොළු අතැතිව පැමිණි මෙම පිරිස නිවසේ සිටි පුද්ගලයන් සිවු දෙනාට පහර දී ඇත. මෙහිදී ඇතිවූ ගැටුමේදී පාර්ශව දෙකට තුවාල සිදු වී ඇති අතර පහර දීමට නතු වූ පුද්ගලයන්ගේ එක් පුත්‍රයෙකු වන තිස් දෙහැවිරි සුනිල් ප්‍රේමරත්න මහතා හිසට සිදු වූ දරුණු තුවාල හේතුවෙන් කතා කිරීමට නොහැකි තත්ත්වයට පත් වී ඇත. ප්‍රහාරයට ලක් වූ පුද්ගලයන් පොලොන්නරුව රෝහල වෙතද පහර දුන් පිරිස වැලිකන්ද රෝහලයට ඇතුළත් කර ඇත. (CMEV)

**33.** ජනවාරි 11 : **එජනිස ආධාරකරුවෙකුගේ නිවසට ගිණි**
එක්සත් ජාතික පක්ෂයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ආනන්ද විසින් මෙහෙයවනු ලැබූ එජාප ආධාරකරුවන් විසින් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකරුවෙකු වන ඌරුලියගමගේ බන්දුල මහතාගේ නිවස ගිණි තබා ඇත. මෙම සිදුවීම සිදුව ඇත්තේ පස්වරු 10.30ට පමණය. මෙම සිදුවීම පිළිබඳ MCR 66/62 අංකය යටතේ මාදම්පේ පොලීසියේ පැමිණිල්ලක් ගොනු කර ඇත. (CMEV)

**34.** ජනවාරි 11 : **එජනිස ආධාරකරුවෙකුගේ නිවසට ගිණි**
රක්වානේ පිහිටි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකරුවෙකු වන ලයනල් ප්‍රනාන්දු මහතාට අයත් නිවසට ගිණි තබා ඇත. මෙම ප්‍රහාරයට නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ ආධාරකරුවන් සම්බන්ධ බවට ප්‍රනාන්දු මහතා සැක පහළ කළේය. මෙම සිදුවීම සම්බන්ධයෙන් MOIB 138/62 යන අංකය යටතේ පොලිස් පැමිණිල්ලක් ගොනු කර ඇත. (CMEV)

**35.** ජනවාරි 11 : **එජනිස ආධාර කරුවෙකුගේ නිවසට ගල් ප්‍රහාර**
නාඳුනන කණ්ඩායමක් විසින් පොලොන්නරුවේ පිහිටි නිවාසයකට ගල් ප්‍රහාරයක් එල්ල කළ බව වාර්තා විය. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකාරියක වන අනුරාධා සඳමාලිගේ නිවසට මෙලෙස ගල් ප්‍රහාරය එල්ල වී ඇත. මෙහිදී නොකඩවා එල්ල වූ ගල් ප්‍රහාර වලින් නිවසට හානි සිදු කර ඇත. මේ සිදුවීම සම්බන්ධයෙන් පොලිස් පැමිණිල්ලක් ගොනු කර නොමැත. (CMEV)

**36.** ජනවාරි 11 : **එජනිස ආධාරකරුවෙකුගේ නිවසට තාර ප්‍රහාර**
නො 530, හුරුළුනික වැව ගලෙන් බිදුණු වැව දරණ ස්ථානයේ පිහිටි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකරුවෙකු වන එන්.එම්. නවරත්න බණ්ඩාර ගේ නිවසට නාඳුනන පිරිසක් විසින් එල්ල කළ තාර ප්‍රහාරයකින් අලාභ හානි සිදු විය. (CMEV)

**37.** ජනවාරි 11 : **එජනිස පක්ෂ කාර්යාලයට ගල් ප්‍රහාර**
පොළොන්නරුවේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පක්ෂ කාර්යාලයකට නාඳුනන පිරිසක් විසින් ගල් ප්‍රහාරයක් එල්ල කර තිබුණි. එහිදී එජනස හි දැන්වීම් පුවරු සහ බැනර් වලටද හානි සිදුවිය. (CMEV)

**38.** ජනවාරි 09 : **එජනිස දේශපාලඥයෙකුගේ නිවසට කඩාපනී**
බොබී දිසානායක ඇතුළු පුද්ගලයන් සය දෙනෙකුගෙන් යුත් කණ්ඩාමක් යටිරාවන පිහිටි කේ.වී.එස් අබේවික්‍රම මහතාගේ නිවසට හොරෙන් ඇතුළු වී ඇත. අබේවිකම මහතා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නායකයෙකි. මෙම පිරිස නිවසේ

උඩුමහලේ ඉස්තෝප්පුවෙන් නිවසට ඇතුළු වී දිසානායක මහතාගේ වැඩිමහල් පුත් නිපුන මහතාට තුවාල සිදු කර ඇති අතර එහිදී ඇති වූ ගැටුමකදී පහරදීමට පැමිණි පිරිසටද තුවාල සිදු වී ඇත. (CMEV)

**39.** ජනවාරි 09 : **එජනිස ආධාරකාරියකගේ නිවසට කඩාපනී**

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකාරියක වන ඒ.ජී. ඩිලානි ගයා සන්ජීවනී ගේ නිවසට කඩා වැදුණු කිසියම් කණ්ඩායමක් විසින් නිවැසියක්ට තර්ජනය කර ඇති බව CMEV වෙත වාර්තා විය. මෙම සිදුවීම සම්බන්ධයෙන් EIB 251/53 දරණ අංකය යටතේ අරගලන්විල පොලීසියේ පැමිණිල්ලක් ගොනු කර ඇත. මෙම ප්‍රහාරයට නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ ආධාරකරුවෙකු වන ධර්මරත්න නැමති පුද්ගලයෙකු සැක කරන බව පැමිණිල්ලේ සඳහන් විය. (CMEV)

**40.** ජනවාරි 09 : **එජනිස ආධාරකරුවෙකුගේ නිවසට කඩා පනී**

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකාරියක වන දුග්ගන්නාරාගගේ බිසෝ මැණිකේ ගේ නිවසටද එවැනිම ප්‍රහාරයක් එදිනම එල්ල වී ඇත. පස්වරු 09.45ට පමණ නිවසට කඩා වැදුන නාඳුනන පිරිසක් විසින් දොර ජනේල් ඇතුළු දේපළ වලට අලාභ හානි සිදු කර ඇත. EIB 258/55 දරණ අංකය යටතේ අරලගන්විල පොලීසියේ පැමිණිල්ලක් ගොනු කර ඇත. (CMEV)

**41.** ජනවාරි 08 : **එජනිස ප්‍රාදේශීය සභා සභාපතිගේ නිවසට ගල් ප්‍රහාර**

නාඳුනන පිරිසක් විසින් ත්‍රිකුණාමලය ප්‍රාදේශීය සභාවේ සභාපති කපිල නුවන් අතුකෝරලගේ නිවසට ගල් ප්‍රහාරයක් එල්ල කරන ලදී. (CMEV)

**42.** ජනවාරි 06 : **එජාප ආධාරකරුවෙකුගේ ව්‍යාපාරික ස්ථානයට ප්‍රහාර**

ජනවාරි 06 වන දින බදුල්ල හාලිඇල පිහිටි එක්සත් ජාතික පක්ෂයේ ආධාරකරුවෙකු වන මුතුබණ්ඩාර මහතාගේ ව්‍යාපාරික ස්ථානට ප්‍රහාරයක් එල්ල කර තිබුණි. අනුරාධ හෝටලයට දෙවරක්ම ප්‍රහාර එල්ල කර ඇති බව මුතුබණ්ඩාර මහතා ප්‍රකාශ විසින් ප්‍රකාශ කළේය. පළමු ප්‍රහාරයෙන් පසු ඔවුන් සුදු පැහැති ඩිෆෙන්ඩර් රථයක නැගී පිටව යන ආකාරය ඔහු දැක ඇති අතර දෙවැනි ප්‍රහාරය සිදුවී ඇත්තේ ඉන් මිනිත්තු 30කට පමණ පසුය. ප්‍රහාරය සඳහා පැමිණි වාහනයේ අංක තහඩුව WP KB – 6570 දරණ බව ඔහු විසින් හඳුනාගෙන ඇත. ප්‍රහාරය සඳහා පැමිණි පුද්ගලයන් යකට පොල්ලකින් මුතුබණ්ඩාර මහතාට පහර දී වෙඩි තබා ඇත. (CMEV)

**43.** ජනවාරි 06 : **එජාප ආධාරකරුවෙකුගේ නිවසට ප්‍රහාර**

ජනවාරි 06 වන දින එක්සත් ජාතික පක්ෂ ආධාරකරුවෙකු වන වී. වීරසිංහ මහතාගේ ඇට්ටම්පිටියේ පිහිටි නිවසට ප්‍රහාරයක් එල්ල වී ඇති අතර එහිදී නිවසේ දොර ජනෙල් වලට සහ වහලයටද හානි සිදු වී ඇත. අමාත්‍ය ඩිලාන් පෙරේරා යටතේ සේවය කරන විදේශ සේවා නියුක්ති කාර්යංශයේ සේවකයන් පිරිසක් මෙම පහර දීම සිදු කළ බව පහර දීමට මුහුණදුන් වීරසිංහ මහතා චෝදනා කළේය.
(CMEV)

**44.** ජනවාරි 06 : **එජාප ආධාරකරුගේ නිවසට ප්‍රහාර**

බෙලිඅත්ත එක්සත් ජාතික පක්ෂයේ සන්නිවේදන අංශයේ ලේකම් එස්.එච්.කුමාරසිරි මහතාගේ නිවසට ජනවාරි 06 වන දින රාත්‍රී 11.45ටප පමණ ප්‍රහාරයක් එල්ල වී ඇත. පැමිණිල්ලේ සඳහන් වූ ආකාරයට මෙහිදී එල්ල කළ වෙඩි ප්‍රහාර වලින් නිවසට සහ නවතා තිබූ ත්‍රී වීල් රථයටද අලාභ හානි සිදු වී ඇත. (CMEV)

**45.** ජනවාරි 06 : **වෙඩි තැබීමකින් එජාප ආධාරකරුවන්ගේ නිවෙස් වලට හානි**

එක්සත් ජාතික පක්ෂ සමාජික සමන්ත ප්‍රේමසිරි සහ පක්ෂයේ ආධාරකරුවෙකු වන ස්මයිල් මෙහොමඩ් ඩිස්තම් යන අයගේ නිවෙස් වලට ජනවාරි 06 වන දින පාන්දර ප්‍රහාර එල්ල වී තිබුණි. එහිදි එල්ල කළ ගල් ප්‍රහාර සහ වෙඩි තැබීම් හේතුවෙන් නිවෙස් වල බිත්ති සහ ජනෙල් වලට අලාභහානි සිදු විය. මේ සිදුවීම් සම්බන්ධයෙන් EIB 105/41 දරණ අංකය යටතේ ප්‍රේමසිරි මහතාද EIB 105/42 දරණ අංකය මොහොමඩ් ඩිෂ්තම් මහතාද පන්නල පොලීසියේ පැමිණිළි ගොනු කර ඇත. (CMEV)

**46.** ජනවාරි 03 : නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ පක්ෂ කාර්යාලයට වෙඩි

පොලොන්නරුවේ පිහිටි නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ පක්ෂ කාර්යාලයකට පස්වරු 06.00 පමණ ප්‍රහාරකයක් එල්ල වී ඇත. ටී 56 තුවක්කු රැගෙන ඩිෆෙන්ඩර් රථ 10කින් පමණ පැමිණි 50ක්ගෙන් පමණ යුතු කණ්ඩායමක් මෙම ප්‍රහාරය එල්ල කළ බව සිද්ධිය ඇසින් දුටුවෙක් ප්‍රකාශ කළේය. ආසන්නයේ නවත්වා තිබූ යතුරුපැදියකට, ලොරියකට සහ දැන්වීම්

පුවරු හා බැනර් වලට මෙම ප්‍රහාරයෙන් අලාභ හානි සිදුවී තිබුණි. මෙම සිදුවීම සම්බන්ධයෙන් අරලගන්විල පොලීසියේ පැමිණිලි 03ක් ගොණු කර ඇත. (CMEV)

**47.** ජනවාරි 02 : පක්ෂය මාරු කළ එජනිස දේශපාලඥයෙකුගේ නිවසට වෙඩි

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ වයඹ පළාත් සභා මන්ත්‍රී ලක්ෂ්මන් වෙඩරුව මහතාගේ නිවසට රාත්‍රී 11.45ට පමණ වෙඩි ප්‍රහාරයක් එල්ල වී ඇත. මෙම සිදුවීම සිදුවී ඇත්තේ වෙඩරුම සමතා එක්සත් ජනතා නිදහස් සන්ධානය හැර දමා පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාට සහය පළ කිරීමෙන් පසුවය. හඳුනා නොගත් අංක තහඩුවක් සහිත ජීප් රථයකින් පැමිණි පිරිසක් විසින් වෙඩරුව මහතාගේ රියදුරු සමරකෝන්ගේ අබේකෝන් මහතාට වෙඩි තබා තිබුණි. මෙම සිදුවීම අවස්ථාවේදී වෙඩරුව මහතා රැස්වීමකට සහභාගී වෙමින් සිට ඇත. අබේකෝන් මහතා ගේට්ටුව අසල වාහනයක හඬ ඇසීමෙන් ඒ පිළිබඳ විමසීමට යන අවස්ථාවේදී මෙම වෙඩි තැබීම සිදු කර ඇත. වෙඩි තැබීමෙන් ලද තුවාල හේතුවෙන් අබේකෝන් මහතාව කුරුණෑගල මහ රෝහලේදී සුළු ශල්‍යකර්මයකට භාජනය කෙරිණි. (CMEV / http://www.adaderana.lk/news/29287/shots-fired-at-lakshman-wendaruwas-home-1-injured)

**48.** ජනවාරි 01 : එජාප සංවිධායකගේ නිවසට ප්‍රහාර

එක්සත් ජාතික පක්ෂයේ බෙලිඅත්ත මැතිවරණ සංවිධායක බී.ඩබ්. විමල් ජයසිරි මහතාගේ නිවසට පස්වරු 06.45ට පමණ ප්‍රහාරයක් එල්ල වූ බව වාර්තා විය. ජයසිරි මහතා ප්‍රකාශ කළ ආකාරයට හෙතෙම පක්ෂ ආධාරකරුවන් තිදෙනෙකු සමග සාකච්ඡාවක නිරත වෙමින් සිටියෙදී සය දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් එම ස්ථානයට යතුරු පැදි වලින් පැමිණ ඇත. ටී 56 තුවක්කු රැගත් පුද්ගලයෙන් දිවූ දෙනෙකු විසින් අහසට වෙඩි තබා අසල තිබූ මැතිවරණ ප්‍රචාරක පුවරු ඉවත් කර නිවෙසට ඇතුළු වී ගෘහ භාණ්ඩ වලට අලාභ හානි සිදු කර වැදගත් ලිපි ලේඛන ද විනාශ කර දමා ඒ මහතගේ බිරිද ඒ.එම්.පී. ප්‍රියංකා මහත්මියට පහර දී ඇත. ප්‍රහාරයෙන් ඇගේ නලලට තුවාල සිදු වී ඇත. ඔවුන්ගේ නිවසේ නවතා තිබුණු යතුරුපැදි හතරකටද ප්‍රහාරයෙන් හානි සිදු වී ඇත. (CMEV)

**49.** දෙසැම්බර් 28: **එජාප පක්ෂ කාර්යාලයට පහර දෙයි**

බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය මිඩහංගල හදිංයේ පිහිටි, පළාත් සභා මන්ත්‍රී එම්. සූරසේන මහතා විසින් පවත්වාගෙන යනු ලැබූ එක්සත් ජාතික පක්ෂ කාර්යාලට ප්‍රහාරයක් එල්ල වී ඇත. මෙම ප්‍රහාරය සිදු වී ඇත්තේ 28 වන දින රාත්‍රී 10.00 පමණය. රතු පැහැති ඩිෆෙන්ඩර් රථයකින්, සුදු පැහැති ටෘප ජීප් රථයකින් සහ නවාරා කැබ් රථයකින් පැමිණි 15 දෙනෙකුගෙන් පමණ යුතු නාඳුනන කණ්ඩායමක් විසින් මෙම ප්‍රහාරය එල්ල කර ඇත. ආයුධ රැගත් පුද්ගලයන් සිවු දෙනෙකු විසින් අහසට වෙඩි තබා කාර්යාලයේ සිටි පුද්ගලයන් සය දෙනෙකුට පහර දී ඇත. ආබාධිත හමුදා සෙබලෙක් සහ අවුරුදු 13 සහ 15 වියැති දරුවන් දෙදෙනෙකු මෙම ස්ථානයේ සිට ඇත. සිරිසේන මහතා ප්‍රකාශ කළ ආකාරයට මෙම ප්‍රහාරයෙන් පුද්ගලයන් පසු දෙනෙකු තුවාල ලබා ඇති අතර ඉන් එක් අයෙකු බරපතල තත්ත්වයේ පසු වී ඇත. (CMEV)

**50.** දෙසැම්බර් 28 : එජාප පක්ෂ කාර්යාලයට ප්‍රහාර

ගම්පහ දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ එක්සත් ජාතික පක්ෂ කාර්යාලයකට පහර දී 10×4 ප්‍රමාණයේ බැනර් තුනක් සහ අඩි 12ක් දිග යකට පොලු හයක් සොරා ගෙන ඇත. වර්ණකුලසූරිය හෙන්රි ජෝසප් ප්‍රනාන්දු යන අය විසින් මෙම කාර්යාලය පවත්වා ගෙන යනු ලැබිණි. (CMEV)

**51.** දෙසැම්බර් 26 : **එජාප පක්ෂ කාර්යාලයට ප්‍රහාර**

මහනුවර දිස්ත්‍රික්කයේ මනිකිට්ට ප්‍රදේශයේ පිහිටි එච්.ඒ. සිසිල් ජයවර්ධන මහතා විසින් පවත්වාගෙන යන එක්සත් ජාතික පක්ෂ කාර්යාලයට නාඳුනන පිරිසක් විසින් දෙසැම්බර් 26 වන දින ප්‍රහාරයක් එල්ල කර ඇත. ඒ අසල තිබූ පොදු අපෙක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාගේ බැනර් කිහිපයක්ද විනාශ කර තිබුණි. (CMEV)

**52.** දෙසැම්බර් 26 : නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ මැතිවරණ කාර්යාලයට බෝම්බ ප්‍රහාර

එරාවූර් හි සන්දිවෙලි ප්‍රදේශයේ පිහිටුවා තිබුණු පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාගේ මැතිවරණ කාර්යාලයකට රාත්‍රී 11.00 පමණ බෝම්බ ප්‍රහාරයක් එල්ල කර ඇත. හිටපු අමාත්‍ය පිල්ලයාන් මහතාගේ TMVP පක්ෂ සාමාජිකයන් කණ්ඩායමක් මෙම ප්‍රහාරය එල්ල කළ බව පොලීසියට දැනුම් දී ඇත. (CaFFE)

**53.** දෙසැම්බර් 24 : එජාප ප්‍රධාන කාර්යාලයට ප්‍රහාර

එක්සත් ජාතික පක්ෂ ආධාරකරුවන් පිරිසක් සහ විරෝධතාවයේ නියැලෙමින් සිටි Federation of National Organizations හි සාමාජිකයන් අතර ඇති වූ ගැටුමකින් පසුව එජාප ප්‍රධාන කාර්යාලය වන සිරිකොතට ප්‍රහාරයක් එල්ල විය. රජයේ ප්‍රධාන මාධ්‍ය ප්‍රකාශකවරයෙක් වන අමාත්‍ය විමල් වීරවංශ ගේ මූලිකත්වයෙන් ආයතන ගණනාවකගේ

එකතුවකින් සකස් වුණු Federation of National Organizers (FNO) විසින් මෙම ප්‍රහාරය එල්ල කර ඇත. මෙම ප්‍රහාරය සිදුවන අවස්ථාවේදී පොලීසිය ඒ පිළිබඳ කිසිදු පියවරක් නොගත් බව කැෆේ සංවිධානය ප්‍රකාශ කළේය. (CaFFE / CMEV / http://www.asianmirror.lk/news/item/5898-caffe-condemns-the-attack-on-sirikotha)



පොලු රැගත් ප්‍රහාරය සඳහා පැමිණි පුද්ගලයන්
(ඡායාරූපය :CMEV)

**54.** 2014 දෙසැම්බර් 23 : එජාප පක්ෂ කාර්යාලයට පහර දෙයි

පුත්තලම දිස්ත්‍රික්කයේ ආණමඩුව ප්‍රදේශයේ ආඩිගම සහ පාලම සෙරුකලේ හි අළුතින් විවෘත කළ එජාප මැතිවරණ කාර්යාල වලට 23 වන දින ප්‍රහාරයක් එල්ල විය. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ වයඹ පළාත් පහා මන්ත්‍රී සනත් නිශාන්ත මහතාගේ ආධාරකරුවන් පිරිසක් විසින් මෙම ප්‍රහාරය දියත් කළ බව පාර්ලිමේන්තු මන්ත්‍රී පාලිත රංගේබණ්ඩාර කියා සිටියේය. (CMEV)

**55.** 2014 දෙසැම්බර් 08 : පක්ෂය මාරු කළ එජනිස ආධාරකරුවෙකුගේ නිවසට බෝම්බ ප්‍රහාර

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකරුවෙකු වන ජී.පී.එච්.අන්. සරත් රත්නසිරි මහතාගේ නිවසට බෝම්බ ප්‍රහාරයක් එල්ල විය. ප්‍රහාරයට පෙර සතියේදී රත්නසිරි මහතා පොදු අපේක්ෂ මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සහෝදරයෙකු හමු වී සිය සහයෝගය පොදු අපෙක්ෂකයා වෙත පළ කරන බව දැනුම් දී ඇත. මෙම ප්‍රහාරයේ ඒ මහතාගේ නිවසට හානි සිදු වූ අතර විදේශයකදී සකස් කළ බෝම්බ කොටස් අසල තිබී පසුව සොයා ගැණිනි. (CaFFE)



නිවසට බෝම්බ ප්‍රහාරයක් ( ඡායාරූපය: CaFFE)

**56.** 2014 දෙසැම්බර් 07 **: පක්ෂය මාරු කළ එජනිස පාර්ලිමේන්තු මන්ත්‍රී ගේ වාහනට ගල් ප්‍රහාර**
එක්සත් ජනතා සන්ධානයේ සිය එක්සත් ජාතික පක්ෂය වෙත මාරු වූ පාර්ලිමේන්තු මන්ත්‍රී ෆනික් ෆාරුක් මහතාගේ වාහනයට දෙසැම්බර් 07 වන දින ගල් ප්‍රහාරයක් එල්ල වී තිබුණි. ෆාරුක් මහතාගේ වාහනය බොරැල්ල ප්‍රදේශයේදී යතුරු පැදියක ගැටීමෙන් පසුව මෙම මෙම ගල් ප්‍රහාරය එල් වී ඇත. මෙම ප්‍රහාරය දේශපාලන පදනමකින් තොර එකක් බව පොලීසිය සදහන් කළේය. (CaFFE)

**57. 2014 නොවැම්බර් 29 : පොදු අපෙක්ෂකයාගේ සහෝදරයාට අයත් ලොරි රථ වලට ප්‍රහාර**
අරලිය සහල් වෙළද ව්‍යාපාරයේ හිමි කරු වන පොදු අපෙක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සහෝදරයෙකු වන ඩඩ්ලි සිරිසේන මහතාට අයත් ලොරි රථයකට මරදගහමුල ප්‍රදේශයේදී ප්‍රහාරයක් එල්ල විය. මෙම ලොරිය මරදගහමුල සහල් බෙදා හැරීමේ මධ්‍යස්ථානය වෙත සහල් ප්‍රවාහණය කරමින් සිටි අතරතුර මෙම ප්‍රහාරය එල් විය. ලොරියේ රියදුරුට සහ සහායකයාට යතුරු පැදි වලින් පැමිණි මැර පිරිසක් විසින් මෙම පහර දීම සිදු කර තිබුණි.
(http://www.asianmirror.lk/news/item/5321-maithri-s-brother-dudley-sirisena-s-lorry-attacked-in-marandagahamula)
ඩඩ්ලි සිරිසේන මහතාට අයත් සහල් ප්‍රවාහණය කරමින් සිටි තවත් ලොරියක් අතරගම නවත්වා එහි යතුරු පැහැර ගෙන ගොස් ඇති බව බීබීසී සිංහල සේවය වාර්තා කළේය.
(http://www.bbc.co.uk/sinhala/sri_lanka/2014/11/141129_maithree_attack_dudley)

## D. රැස්වීමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝණය කිරීම්

**58.** ජනවාරි 05 **: එජාප රැලියකට සූදානම් වෙමින් සිටියෙදී වෙඩි තැබීමක්**
පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා ඇමතීමට නියමිතව තිබූ රැලියක් සදහා වැඩ කටයුතු සකස් කරමින් සිටි එක්සත් ජාතික පක්ෂයේ ආධකරුවන් වෙත නාඳුනන පිරිසක් විසින් වෙඩි ප්‍රහාරයක් එල්ල කරන ලදී. ඩී.අයි.ඩබ් කරුණාදාස රණසිංහ, එච් හුසේන් දුල්ෂාන් සහ ශාන්ත දොඩංගොඩ යන් පුද්ගලයන් මෙම ප්‍රහාරයෙන් තුවාල ලබා ප්‍රතිකාර සදහා රත්නපුර රෝහලට ඇතුළත් කළ බව බව පොලිස් ස්ථානාධිපති එල්.පී.කේ රාජමන්ත්‍රී මහතා ප්‍රකාශ කළේය. (CMEV)

**59.** ජනවාරි 02 : **පොදු අපේක්ෂකයාගේ රැලියකට ප්‍රහාර**
පැල්මඩුල්ල ඩිපෝව ආසන්නයේ පැවති පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාගේ රැලියකට පස්වරු 7.20ට පමණ ප්‍රහාරයක් එල්ල විය. සබරගමුව පළාත් සභා මන්ත්‍රී මංජුල ඩයස් වික්‍රමනායක මහතා රැලිය අමතා අවසන් වනවාත් සමගම මෛත්‍රීපාල සිරිසේන මහතා වෙත ගල් ප්‍රහාරයක් එල්ල වී ඇත. ආරක්ෂක අංශ විසින් සිරිසේන මහතාව වහාම එම ස්ථානයෙන් ඉවත් කරන ලද අතර මෙම ප්‍රහාරයෙන් තුවාල ලැබූ පැල්මඩුල්ල මැතිවරණ සංවිධායක එච්.ඩී.ඩී සෙනෙවිරත්න මහතා පසුව රෝහල ගත කරන ලදී. සෙනෙවිරත්න මහතාගේ හිසට සිදුවූ සුළු තුවාල හේතුවෙන් ඔහුව රෝහල් ගත කර ඇති බව පැල්මඩුල්ල මහ රෝහලේ ස්ථාන භාර වෛද්‍ය නිලධාරී වෛද්‍ය වරුණ සම්පත් මහතා ප්‍රකාශ කළේය. (CMEV)

**60.** 2014 දෙසැම්බර් 29 : තරුණ කලාකරුවන්ට ප්‍රහාර
කුරුණෑගල දිස්ත්‍රිකකයේ කුඹුක්ගැටේ ප්‍රදේශයේදී මෛත්‍රීපාල සිරිසේන මහතාට සහය දක්වමින් ප්‍රචාරක ව්‍යාපාරයක නිරත වූ තරුණ කලාකරුවන් පිරිසකට ප්‍රදේශයේ දේශපාලඥයෙකුගේ මැර පිරිසක් විසින් ප්‍රහාරයක් එල්ල කළේය. ජනතාව අතර අත් පත්‍රිකා බෙදා හරිමින් සිටි අවස්ථාවේදී තමන්ට මෙම ප්‍රහාරය එල්ල වූ බව අළුත් පරපුර නම් වූ මෙම තරුණ කලා එකමුතුවේ මාධ්‍ය ප්‍රකාශක උදුල් ප්‍රේමරත්න මහතා ප්‍රකාශ කළේය. මෙම ප්‍රහරය එල්ල වන අවස්ථාවේදී එහි සිටි පොලිස් නිලධාරීන් එය වැළැක්වීමට කිසිදු පියවරක් නොගත් බවද හෙතෙම ප්‍රකාශ කළේය. " කුඹුක්ගැටේ ප්‍රදේශයේදී උදේ 11ට පමණ අපි අත් පත්‍රිකා බෙදා හරිමින් සිටියා. පැයක් පමණ ඇතුළත එතුනට ආ මැර පිරිසක් අපට පහර දුන්නා. යොවුන් නිළි සමනලී ෆොන්සේකා සහ ගායක ඉන්ද්‍රචාප ලියනගේ මෙම ප්‍රහාරයේදී තුවාල ලැබුවා. " යනුවෙන් ඔහු තව දුරටත් කියා සිටියේය. " අළුත් පරපුර" පවතින දේශපාලන ක්‍රමයට විරුද්ධව තරුණ කලා කරුවන් විසින් පිහිටුවාගත් එකමුතුවක් වන අතර ඔවුන්ගේ ප්‍රචාරක ව්‍යාපාරය දෙසැම්බර් 29 වන දින කුරුණෑගලදී ආරම්භ විය.
http://www.dailymirror.lk/59937/young-artistes-supporting-ms-attacked

**61.** 2014 දෙසැම්බර් 28 : වන ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ වේදිකාවට වෙඩි
මේ අතර, දෙසැම්බර් 27 වන දින වළස්මුල්ලේදී පැවැති සිරිසේන මහතාගේ මැතිවරණ රැලිය සඳහා සකස් කළ වේදිකාවට 28 වන දින අළුයම 1.30ට පමණ වෙඩි ප්‍රහාරයක් එල් විය. (CaFFE)

**62.** 2014 දෙසැම්බර් 27 : **එජාප රැලියට ගල් ප්‍රහාර**
පොදු අපේක්ෂයා වෙත සහය පල කිරිම සඳහා අක්කරෛපත්තු ප්‍රදේශයේ සූදානම් කර තිබුණු එක්සත් ජාතික පක්ෂ රැලියකට රාත්‍රී 7ත් 8ත් අතර කාලයේදී ගල් ප්‍රහාර දෙකක් එල්ල විය. විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ රැළිය අමතමින් සිටි අවස්ථාවේදී මෙම ප්‍රහාරය එල්ල වී ඇති අතර වේදිකාවේ පිහිටුවා තිබුණු මයික්‍රොෆෝන්යටද ගල් ප්‍රහාර වැදී ඇත. කෙසේ වුවත් වික්‍රමසිංහ මහතාගේ කතාව නොනවත්වා පැවැත්විණි. (CaFFE)

**63.** 2014 දෙසැම්බර් 27 : නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ වේදිකාවට වෙඩි
දෙසැම්බර් 27 වන දින වලස්මුල්ලේ පැවති රැලිය සඳහා සකස් කළ වේදිකාවට වෙඩි තබා ඇත. (CaFFE)

**64.** 2014 දෙසැම්බර් 23**: නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ වේදිකාවට වෙඩි**
දෙසැම්බර් 23 වන දින ඩිෆෙන්ඩර් රථයකින් සහ වෑන් රථයකින් පැමිණි තුවක්කුකරුවන් පිරිසක් වෙඩි තැබීම් සිදු කළ බව විසින් එක්සත් ජාතික පක්ෂයේ කොළොන්නාව සංවිධායක පළාත් සභා මන්ත්‍රී එස්.එම්. මරික්කාර් ප්‍රකාශ කළේය. (CMEV)

**65.** 2014 දෙසැම්බර් 24 : **නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ වේදිකාවට වෙඩි**
කොළඹ දිස්තික්කයේ උමාගිලිය ක්‍රීඩා පිටියේ පැවැත්වීමට නියමිතව තිබුණු පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාගේ රැලියක් සඳහා වේදිකාව සහ භූමිය සකස් කරමින් සිටි අවස්ථාවේදී කිසියම් පිරිසක් විසින් 24 වන දින එයට ප්‍රහාරයක් එල්ල කර තිබුණි. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ පෝස්ටර් ප්‍රදර්ශය කළ ජීප් රථ දෙකක් සහ වෑන් රථයක් අදාල ස්ථානය ට පැමිණ වැල්ලම්පිටිය පොලීසියට අයත් ජීප් රථයක් අසල නවත්වා ඇත. ඉන් එක් වාහනයකින් බිමට බට ආයුධ අතැති පුද්ගලයෙකු විසින් වේදිකාව සහ එහි වහලය දෙසට 17 වතාවක් පමණ වෙඩි තබා තිබුණි. වැල්ලම්පිටිය පොලීසියේ උප පොලිස් පරීක්ෂක තෙන්නකෝන් මහතා සහ තවත් පොලිස් නිලධාරීන් නව දෙනෙකු ඇතුළු වේදිකාව සකස් කරමින් සිටි පිරිසට මෙම වෙඩි තැබීම් හමුවේ දිව ගොස් සැඟ වන්නට සිදු විය. (CMEV)

**66.** 2014 දෙසැම්බර් 22 : රාජපක්ෂ විරෝධී වීදි නාට්‍ය කණ්ඩායමකට ප්‍රහාර
වීදි නාට්‍ය කණ්ඩායම ඇතුළු වීදියේ විරෝදය ව්‍යාපාරට සම්බන්ධ විපක්ෂ ක්‍රියාකාරීන් පිරිසකට හම්බන්තොටදී ප්‍රහාරයක් එල්ල විය. මෙම ප්‍රහාරය එල්ල කළේ හම්බන්තොට නගරාධිපති එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු විසින් මෙහෙය වූ මැර

කණ්ඩායමක් විසිනි. මෙහිදී එරාජ් ප්‍රනාන්දු මහතා ආයුධ අතැතිව සිටි බවත් වීදියේ විරෝධය ව්‍යාපාරයේ නායකයෙකු වන ජයතිලක බණ්ඩාර මහතාව පැහැරගෙන යාමට උත්සහ කළ බවත් වාර්තා විය. (CaFFE)




ප්‍රහාරයට ලක්වූ ගායකයෙකු සහ මානව හිමිනම් ආරක්ෂකයෙකු වන ජයතිලක බණ්ඩාර ව සගයන් විසින් එම ස්ථානයෙන් ඉවත් කරන අයුරු

**67.** 2014 දෙසැම්බර් 21: **රැලියක් සඳහා සූදානම් වෙමින් සිටි නව ප්‍රජාතන්තවාදී පෙරමුණේ ආධාරකරුවන්ට ප්‍රහාර**

දෙසැම්බර් 24 වන දින වැල්ලම්පිටිය ප්‍රදේශයේදී පැවැත්වීමට නියමිතව තිබූ පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාගේ රැලියක පූර්ව ප්‍රචාරක කටයුතු වල නියැලෙමින් දෙසැම්බර් 21 වන දින පෝස්ටර් අලවමින් සිටි පුද්ගලයන් පිරිසකට සුදු වෑන් රථයකින් පැමිණි පිරිසක් විසින් පහර දී ඇත. ආයුධ අතැතිව පැමිණි මෙම පිරිස විසින් තියුණු ආයුධයකින් කළ පහර දීමක් නිසා පුද්ගලයන් දෙදෙනෙකු රෝහල් ගත කෙරුණි. (CaFFE)

**68.** 2014 දෙසැම්බර් 18 : වදුරඹ නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ වේදිකාවට ගිනි

පොදු අපේකෂක මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ගාලු දිස්ත්‍රික්කයේ වදුරඹ මැතිවරණ කොට්ඨාශයේ බද්දේගම රැලිය සඳහා සකස් කර තිබුණු මැතිවරණ වේදිකාවට සහ ශබ්ද විකාශන යන්ත්‍රයට රජයේ දේශපාලඥයෙකු විසින් මෙහෙයවන ලද මැර පිරිසක් විසින් ගිනි තබන ලදී.

(CaFFE / https://www.ceylontoday.lk/51-80210-news-detail-maithris-wanduramba-election-stage-attacked.html)



දෙසැම්බර් 18 වන දින වදුරඹ පැවැත්වීමට නියමිතව තිබූ විපක්ෂයේ රැලියකට රජයේ දේශපාලඥයෙකු ප්‍රමුඛ මැර පිරිසක් විසින් ගිණි තබා ඇත. (ඡායාරූපය: අන්තර්ජාලය)

**69.** 2014 දෙසැම්බර් 16 **: නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ වේදිකාවට ප්‍රහාර**

දෙසැම්බර් 16 වන දින රාත්‍රියේ කඩා වැදි පිරිසක් විසින් අහංගම ප්‍රදේශයේ සකස් කර තිබුණු නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ මැතිවරණ වේදිකාව සහ සැරසිලි විනාශ කර දමනු ලැබ තිබුණි. පොලිස් නිලධාරීන් පිරිසක් විසින් වේදිකාව සරසමින් සිටි පුද්ගලයන්ට තර්ජනය කළ බව එක්සත් ජාතික පක්ෂයේ හිටපු පළාත් සභා මන්ත්‍රී මෛත්‍රී ගුණරත්න මහතා ප්‍රකාශ කළේය. (CaFFE)

**70.** 2014 දෙසැම්බර් 09 : වන ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ රැස්වීමක් පැවැත්වීම නිසා හෝටලයකට ප්‍රහාර

දෙසැම්බර් 09 වන දින හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය විසින් මෙහෙය වූ රැස්වීමකට කඩා වැදි ඩිෆෙන්ඩර් රථ වලින් පැමිණි පිරිසක් විසින් රැස්වීම කඩාකප්පල් කර දමන ලදී. මෙහිදී හෝටලයේ කාමර 21ක ජනේල වලට හානි සිදු විය. (CMEV)

**71.** 2014 දෙසැම්බර් 08 **: රැලියකයට සූදානම් වෙමින් සිටි නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ ආධාරකරුවන්ය ප්‍රහාර**

මහනුවරදී පැවැත්වීමට සූදානම් කර තිබුණු රැලියක පෝස්ටර් අලවමින් සිටි නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ ආධාරකරුවන් පිරිසක් වෙත දෙසැම්බර් 08 වන දින කඩුගන්නාව ප්‍රදේශයේදී ප්‍රහාරයක් එල්ල වී ඇත. තිස් දෙනෙකුගෙන් පමණ යුතු කණ්ඩායමක් මෙම ප්‍රහාරය සඳහා පැමිණ සිටි අතර එජාප පළාත් සභා මන්ත්‍රී ජයවීර බණ්ඩාර මෙම ප්‍රහාරයෙන් තුවාල ලැබීය. (CaFFE)

**72.** 2014 දෙසැම්බර් 08 : රාවය පුවත්පතේ කර්තෘගෙන් ප්‍රශ්ණ කරයි

රාජ්‍ය රහස් ඔත්තු සේවාවලින් ලබා ගත් තොරතුරු මත පළ වූ ප්‍රවෘත්තියක් පිළිබඳව ප්‍රශ්න කිරීමට රාවය පුවත් පතේ ප්‍රධාන කර්තෘ නීතිඥ කේ.ඩබ්. ජනරංජන මහතා ව අපරාධ විමර්ශන ඒකකය වෙත කැඳවා ප්‍රශ්න කරන ලදී. ජනාධිපතිවරණයෙන් මෛත්‍රීපාල සිරිසේන මහතා ඡන්ද 59%ක්ද මහින්ද රාජපක්ෂ මහතා 41%ක්ද ලබා ගන්නා බවට පළවූ ප්‍රවෘත්තික් මෙම ප්‍රශ්න කිරීම් වලට හේතු විය. මෙම ප්‍රවෘත්තිය පොලිස් බුද්ධි අංශයේ හිටපු ප්‍රධානී චන්ද්‍රා වාක්ෂිට

මහතාට විරුද්ධව කළ පෞද්ගලික ප්‍රහාරයක් බවට චෝදනා කරමින් ජනරංජන මහතාව මෙසේ ප්‍රශ්ණ කිරීමට ලක් කෙරුණි. චන්ද්‍රා වාක්ෂිට මහතා හෝ පොලිස් දෙපාර්තමේන්තුව අපකීර්තියට පත් වන කිසිදු කරුණක් ප්‍රවෘතියේ ඇතුළත් වූයේ නැත.
(http://www.lankatruth.com/home/index.php?option=com_content&view=article&id=7950:ravaya-editor-called-to-cid&catid=36:top-stories&Itemid=124)




රාවය කර්තෘ ජනරංජනගෙන් ප්‍රශ්න කරයි (ඡායාරූපය: Internet)

**73.** 2014 දෙසැම්බර් 06 : **හිටපු ජනාධිපතිනියට ප්‍රහාර**
හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියට සහ පළාත් සභා මන්ත්‍රීනි හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මෙනෙවියට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකරුවන් විසින් පහර දෙන ලදී. පොදු අපෙක්ෂකයා වෙත සහය පළ කරන රැස්වීමකයට සහභාගී වී පළාත් සභා මන්ත්‍රී මෙහොමඩ් ජෙමිනි මාකර් ඉශ්තිකාර් මහතාගේ නිවසේ රාත්‍රී භෝජනය සදහා ගිය අවස්ථාවේදී මෙම ප්‍රහාරය එල්ල වී ඇත. මෙම පිරිස රාත්‍රී භෝජනය ගනිමින් සිටි අතරතුර එජනිස ආධාරකරුවන් අදාල නිවස දෙසට හූ කියමින් ගල් ප්‍රහාර එල්ල කර ඇත. කුමාරතුංග මහත්මිය සහ ප්‍රේමචන්ද්‍ර මෙනෙවිය සිය ආධාරකරුවන් සමග එම ස්ථානයෙන් වහාම ඉවත්ව යාමට සමත් විය. (CMEV)

**74.** 2014 දෙසැම්බර් 06 : **රාජපක්ෂ රජය විවේචනය කරන ජනමාධ්‍යවේදියෙකුට තර්ජන**
ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියෙකු සහ යාපනය ප්‍රෙස් ක්ලබ් හි උපදේශකයෙකු වන ආර්. දයාබරන් මහතාට නාඳුනන දුරකතනයකින් තර්ජනාත්මක ඇමතුම් ලැබී ඇත. මෙම දුරකතන ඇමතුම් ලැබී ඇත්තේ රාජපක්ෂ රජයේ මර්දනකාරී වැඩපිළිවෙල විවේචනය කරමින් පැවැත්වුණු ජනමාධ්‍යවේදීන්ගේ විරෝධතාවයකට සහභාගී වීමට කොළඹ බලා එමින් සිටියෙදීය. ආරක්ෂක නිලධාරීන් විසින් දයාබරන් මහතාට මීට පෙරදීද හිරිහැර සිදු කර ඇත.

**75.** 2014 දෙසැම්බර් 05 r : **රාජපක්ෂ විරෝධී වීදි නාට්‍ය කණ්ඩායමට ප්‍රහාරයක්**
දෙසැම්බර් 05 වන දින එප්පාවල ප්‍රදේශයේදී 'වීදියේ විරෝධය' වීදි නාට්‍ය කණ්ඩායම ප්‍රහාරයකට මුහුණ දුන්නේය. උතුරු මැද පළාතේ පළාත්සභා මන්ත්‍රී එස්.එම්. රංජිත් සමරකෝන් ගේ ආධාරකරුවන් විසින් මෙම ප්‍රහාරය එල්ල කළ බව වීදි නාට්‍ය කණ්ඩායම ප්‍රකාශ කළේය. (CaFFE)

**76.** 2014 දෙසැම්බර් 05 : එජනිස ආධාරකරුවෝ ජනමාධ්‍යවේදියාට පහර දී තර්ජනය කරති
දෙසැම්බර් 05 වන දින වීදියේ විරෝධය වැඩසටහන ආවරණය කරමින් සිටියෙදී හිරු ටීවී හි සහ අද පුවත්පතේ අනුරාධපුර වාර්තාකරු තිසර සමල් සෝමරත්න මහතා ප්‍රහාරයකට මුහුණ දුන්නේය. ඔහුට පහර දුන්නේ උතුරුමැද පළාත් සභාපති එස්.එම්. රංජිත් සමරකෝන් ගේ ආධාරකරුවන් බව ඔහු ප්‍රකාශ කළේය. ප්‍රහාරයෙන් ලද තුවාල වලට ප්‍රතිකාර ගැනීමට එප්පාවල රෝහලට ඔහුව ඇතුළත් කරන ලද අතර රෝහල් භූමියට පැමිණි කිසියම් කණ්ඩායමක් විසින් එහිදී සෝමරත්න මහතාට තර්ජනය කර ඇත. තමා රෝහලෙන් ඉවත්ව නොගියහොත් තමා ඉදිරියේ තම දෙමාපියන් මරා දමන බවට මෙම පිරිස තර්ජනය කළ බව ඔහු මාධ්‍යයට පැවසීය.
(http://www.sundaytimes.lk/141207/news/journalist-allegedly-assaulted-by-upfa-supporters-threatened-in-hospital-131557.html)

**77.** 2014 නොවැම්බර් 25 : **එජාප පාර්ලිමේන්තු මන්ත්‍රීගේ පක්ෂ කාර්යාලයට ගිණි**
එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.එම්.ඒ හලීම් ගේ මාවිල්මඩ පිහිටි පක්ෂ කාර්යාලයට මෙදින පාන්දර කිසියම් පිරිසක් විසින් වෙඩි තබා තිබුණි. කාර්යාලයේ ජනේල සහ බිත්ති වලට මෙහිදී හානි සිදුවිය. හලීම් මහතා පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාට ක්‍රියාකාරී ලෙස සිය සහයෝගය ලබා දුන් අයෙකි. (CaFFE)

**78.** 2014 නොවැම්බර් 23 : එජාප ආධාරකරුවන් ගේ නිවෙස් වලට ප්‍රහාර
මාදම්පේ මැදගම පිහිටි ප්‍රබල එක්සත් ජාතික පක්ෂ ආධාරකරුවෙකු වන මිල්ටන් නැමති පුද්ගලයාගේ නිවසට මධ්‍යම රාත්‍රියෙන් පසුව ප්‍රහාර දෙකක් එල්ල වී තිබුණි. මැදමග පාසල් පටුමගේ පිහිටා ඇති සුදේශ් ප්‍රියංකර යන අයගේ නිවසටද ප්‍රහාරයක් එල්ල වී ඇත. පොදු අපේක්ෂකයා ලෙස මෛත්‍රීපාල සිරිසෙන මහතා ඉදිරිපත් වන බව නිවේදනය කළ මෙහොතේ මෙම පුද්ගලයන් දෙනොම රතිඤ්ඤා පුපුරවා ඇත. පාන්දර 12.20 ට පමණ යතුරුපැදි වලින් පැමිණි පිරිසක් විසින් සිය නිවසට වෙඩි තැබූ බව මිල්ටන් මහතා ප්‍රකාශ කර තිබුණි. ඔවුන් පිටව ගිය පසු එළියට පැමිණි නිවැසියන්ට ඔවුන් නැවත වරක් වෙඩි තබා ඇත. (CaFFE/ http://www.asianmirror.lk/news/item/5321-maithri-s-brother-dudley-sirisena-s-lorry-attacked-in-marandagahamula)

## E. ඡන්දපළ නිලධාරීන්ට සහ මැතිවරණ නිරීක්ෂකයින්ට පහරදීම්, තර්ජන සහ තහංචි

**79.** ජනවාරි 08 : **ඡන්දපළ නිලධාරීන්ට ප්‍රහාර**
ගම්පොළ ගල් විහාර ගොඩනැගිල්ලේ ඡන්ද මධ්‍යස්ථානයේ සේවයේ යොදවා තිබුණු ඡන්දපළ නිලධාරීන්ට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නාගරික මන්ත්‍රී දර්ශන නයනතරංග සහ ඔහුගේ ආධාරකරුවන් විසින් පහර දී ඇත. ඡන්දපෙට්ටි ගණන් කිරීමේ මධ්‍යස්ථාන වෙත ගෙන යාමට සූදානම් කර සුළු මොහොතකින් එස්.ජී.එච්.එම්. ජයලාල්, එස්.එල් බණ්ඩාර, එස්. ප්‍රසාද් කුමාර මෙලෙස පහරදීමට ලක් වී ඇත. (CMEV)

**80.** 2014 ජනවාරි 07 : **මැතිවරණ නිරීක්ෂකයෙකුට මරණ තර්ජන**
එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල්සිරි විසින් CMEV මැතිවරණ නිරීක්ෂක ආර්.එස්.එස් දොරගමුව මහතාට තර්ජනය කර ඇත. ජනවාරි 09 වන දින ඔහුගේ අතපය කඩන බවට මරා දමන බවට මෙම තර්ජන එල්ල වී ඇත. ජනාධිපති රජපක්ෂට සහය නොදීමත් මැතිවරණ නිරීක්ෂන කටයුතු වල නිරත වීමත් මෙම තර්ජනය වලට හේතු වී ඇත. (CMEV)

**81.** 2014 දෙසැම්බර් 30 : මැතිවරණ නිරීක්ෂකයෙකුට පහර දෙයි
මැතිවරණය ජයග්‍රහනය කිරිම සඳහා උත්සහ කරන පිරිස් දෙකකගේ ඡායාරූප ගැනීමට උත්සහ දැරීමේදී CMEV මැතිවරණ නිරීක්ෂක ජේ.පී.ඒ.එම්. ජයසේකර මහතා පහරදීමකට ලක් විය. මෙම සිදුවීමෙන් පසු අවස්ථා දෙකකදී ජයසේකර මහතාට තර්ජනය කර පහර දී ඇත. පොලොන්නරු පොලිස් ස්ථානාධිපති ජී.ඒ.එන්.එල් විජේසේන මහතා හමුවේ මෙම සිදුවීම පිළිබඳ පැමිණිල්ලක් ගොනු කර ඇත. (CMEV)